# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2242/2 - 2021 අගෝස්තු මස 24 වැනි අඟහරුවාදා - 2021.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

1. මහාචාර්ය කපිල පෙරේරා මැතිතුමා
   ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
2. එන්.එච්.එම්. චිත්‍රානන්ද මැතිතුමා
   ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
3. එස්.එච්. හරිස්චන්ද්‍ර මැතිතුමා
   ලේකම්, දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
4. කේ.එම්.එස්.ඩී. ජයසේකර මැතිතුමිය
   ලේකම්, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
5. ආචාර්ය එම්. උපාලි සේදර මැතිතුමා
   ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
6. මහාචාර්ය සම්පත් අමරතුංග මැතිතුමා
   සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
7. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජේරත්න මැතිණිය
   උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

1A - G 34882 — 380 (2021/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. මහාචාර්ය යූ.බී. දිසානායක මැතිතුමා
   උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
9. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිතුමා
   උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
10. මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මැතිතුමිය
   උපකුලපති, කැළණිය විශ්වවිද්‍යාලය
11. මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන මැතිතුමා
   උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය
12. මහාචාර්ය එස්. ශ්‍රීසත්කුණරාජා මැතිතුමා
   උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය
13. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී. අමරසේන මැතිතුමා
   උපකුලපති, රුහුණු විශ්වවිද්‍යාලය
14. මහාචාර්ය එස්.ඒ. අරියදුරෙයි මැතිතුමා
   උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
15. මහාචාර්ය එෆ්.සී. රේගල් මැතිතුමා
   උපකුලපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය
16. මහාචාර්ය එම්.එම්.එම්. නජීම් මැතිතුමා
   උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය
17. ආචාර්ය බී.ඒ. කරුණාරත්න මැතිතුමා
   උපකුලපති, රජරට විශ්වවිද්‍යාලය
18. මහාචාර්ය අතුල ගුණපාල මැතිතුමා
   වැඩබලන උපකුලපති, සබරගමුව විශ්වවිද්‍යාලය
19. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.යූ.කේ. ජයසිංහ මැතිතුමා
   උපකුලපති, වයඹ විශ්වවිද්‍යාලය
20. ආචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා
   වැඩබලන උපකුලපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
21. මහාචාර්ය ඩබ්.එම්. අබේරත්න බණ්ඩාර මැතිතුමා
   නිසි බලධාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
22. ගරු මාර්ක් බිලිමෝරා පියතුමා
   විදුහල්පති, ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස
23. ගරු ඇලෙක්සැන්ඩ්‍රා මෙන්ඩිස් කන්‍යා සොයුරිය
   විදුහල්පති, ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07
24. එස්.එම්. කීර්තිරත්න මැතිතුමා
   විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
25. සඳමාලි අවිරුප්පොල මැතිණිය
   විදුහල්පතිනිය, විශාඛා විද්‍යාලය, කොළඹ 05
26. ඩබ්.එම්.ඩී.ටී.පී. වනසිංහ මැතිතුමා
   විදුහල්පති, ධර්මරාජ විද්‍යාලය, මහනුවර
27. එෆ්. වෙලේගේ මැතිතුමා
   විදුහල්පති, රාහුල විද්‍යාලය, මාතර
28. වෛද්‍ය හර්ෂ අලස් මැතිතුමා
   සභාපති, ගේට්වේ පාසල් සමූහය
29. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමා
   අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
30. බී. සනත් පූජිත මැතිතුමා
   විභාග කොමසාරිස් ජනරාල්
31. පී.එන්. අයිලප්පෙරුම මැතිතුමා
   අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), අධ්‍යාපන අමාත්‍යාංශය

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.03.31 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, එන්.එච්.එම්. චිත්‍රානන්ද මැතිතුමා, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්කර ඇති බැවින් සහ මෙම ජනාධිපති කාර්ය සාධක බලකායේ ලේකම් ලෙස කටයුතු කළ දීපා ලියනගේ මහත්මිය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස පත්කර ඇති හෙයින් ද,

තවද, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති ආචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා, එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින් ද,

තවද, පේරාදෙණිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, අග්නිදිග, සබරගමුව සහ සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලයන්ට නව උපකුලපතිවරුන් පත්කර ඇති හෙයින් ද,

තවද, නව අධ්‍යාපන ප්‍රවණතාවයන් සැලකීමේ දී තොරතුරු තාක්ෂණය ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බව අවධානයට ලක් කරමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත විධානයේ 2, 8, 14, 16, 18, 20 සහ 21 යන සාමාජිකයින් වෙනුවට සහ ඊට අමතරව නව සාමාජිකයකු වශයෙන්, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටවනු ලැබූ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ කාර්ය සාධක බලකායට පහත සඳහන් සාමාජිකයින් ද මෙයින් පත් කරමි.

1. දීපා ලියනගේ මහත්මිය
   ලේකම්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
2. මහාචාර්ය එම්.ඩී. ලමාවංශ මැතිතුමා
   උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3. මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න මැතිතුමා
   උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ඒ. රමීස් මැතිතුමා
   උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය
5. මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක මැතිතුමා
   උපකුලපති, සබරගමුව විශ්වවිද්‍යාලය
6. ආචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා
   උපකුලපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
7. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.පී. මහලියනආරච්චි මැතිතුමා
   උපකුලපති, සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
8. ඕෂද සේනානායක මහතා
   සභාපති, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

තවද,මෙම කාර්යසාධක බලකායේ නව ලේකම් වශයෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා පත් කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ අගෝස්තු මස 18 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.